පුද්ගලයකුගේ ජාතිකත්වය යම් පුවතකට සෘජුවම අදාළ වේ නම් එය ප්‍රකාශයට පත් කිරීමේ ගැටළුවක් නැත. කෙසේ නමුත්, සෘණාත්මක සන්දර්භයන් (negative context) තුළ පුද්ගලයෙකුගේ ජාතියක් හෝ ජාතිකත්වයක් සඳහන් කිරීම තුළින්, එම ජාතිය සෘණාත්මකව ඒකාකෘතික නොවනු ඇති දැයි පාඨක අප ඇසිය යුතු වේ.
මෙවැනි අවස්ථාවන්ට උදාහරණයක් ලෙස, "චීනා", "චීනුන්" වැනි යෙදුම් පෙන්වා දිය හැක. චීන ජාතිකයින් සම්බන්ධ වන සෘණාත්මක සන්දර්භයන් බොහෝමයක් වාර්තා කිරීමේදී, මාධ්‍ය විසින් ඉහත ආකාරයේ යෙදුම් භාවිතා කරනු දක්නට හැක. එවැනි යෙදුම් දිගින් දිගටම භාවිතා කිරීම ඔස්සේ, චීන ජාතිකයින් කෙරෙහි විදේශික භීතිකාවක් (xenophobia) පවා ජනිත නොවනු ඇතිදැයි අපට ඇසීමට සිදුවේ.
මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ ගබඩාවේ තිබූ ගජමුතු කිහිපයක් විදේශිකයන්ට විකිණීමට තැත් කිරීමේ සිදුවීමක් සම්බන්ධයෙන්, මාර්තු 27, 2023 දින පුවත්පත් තුළ මෙසේ දැක්වී තිබිණි.
* ලංකාදීප - "නඩු භාණ්ඩ ගබඩාවේ ගජමුතු 5ක් චීනුන්ට විකුණද්දී මාට්ටු"
* දිනමිණ - "නඩු භාණ්ඩ කාමරයෙන් ඉස්සූ ගජමුතු චීනෙකුට විකුණන්න හදලා"
* අද - "නඩු භාණ්ඩ ලෙස තිබුණු ගජමුතු 5ක් රු.ලක්ෂ 120 කට විකුණන්න හදලා"
ඔබගේ අදහසට අනුව,
1) "චීනුන්", "චීනෙක්" යන යෙදුම් ඔස්සේ, චීන ජාතිකයින් කෙරෙහි අවමානාත්මක, කොන් කිරීමේ අදහසක් ජනිත නොවන්නේ ද?
2) ඒ අනුව, මෙම පුවත් වාර්තාවන් අතරින්, වඩාත් ආචාර ධාර්මික පුවත් වාර්තාව ලෙසින් ඔබ තෝරා ගන්නේ කුමක්ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

